**සිංහල පරිවර්තනය**

**නිවේදන අංක: R/2026/16**

## උතුරු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ අංක CP/DEC/25 දරණ 2025.07.16 දිනැති ලිපිය මගින් යොමුකරන ලද 2025.07.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, උතුරු පළාත් නියෝජ්‍ය ලේකම් - පරිපාලන ගේ අංක NP/02/01/RECRUITMENT/GENERAL දරණ 2026.09.28 දිනැති ඉල්ලීම් ලිපියට අනුව, උතුරු පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක NP/01/02/07/01/19 දරණ 2026.09.30 දිනැති නිර්දේශයට අනුව, උතුරු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ 2 වන පන්තියේ **II** ශ්‍රේණියේ පවතින පුරප්පාඩු **දෙකක් (02)** සඳහා බඳවා ගැනීම වෙනුවෙන් පැවැත්වෙන විවෘත තරඟ විභාගය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2026 නොවැම්බර්** මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026.10.30** වේ.

### **02.** බඳවා ගැනීමේ සේවා කොන්දේසි

02.1 2013.01.01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද උතුරු පළාත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කොන්දේසි වලට සහ එහි කලින් කලට සිදුකරන ලද සංශෝධනවලට අනුව ද, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1817/30 දරණ 2013.07.03 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වන කාර්ය පටිපාටික රීති සහ සහ මෙම තනතුරට අදාළව කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි, නීති, නියෝග යනාදියට යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ 2 වන පන්තියේ **II** ශ්‍රේණියට පත්කරනු ලැබේ.

02.2 මෙම තරඟ විභාගය මගින් පත්වීමක් සඳහා තෝරාගන්නා අපේක්ෂකයින් තම පත්වීම් දිනයේ සිට වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ 2 වන පන්තියේ** II **ශ්‍රේණියට** පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි. සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් පරිදි **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ 2 වන පන්තියේ** II **ශ්‍රේණියට** පත් වූ දින සිට වසර **තුනක් (03)** ඇතුළත පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරුවලට යටත්වන සේවයකි. එබැවින් මෙම තනතුරට පත්කරනු ලබන අයදුම්කරුවන් "උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය" යන කොන්දේසියට යටත් විය යුතුය.

02.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දී නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දිනයේ සිට **වසර 03 ක්** අවසන් වීමට ප්‍රථම නියම කර ඇති දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

02.5 විවෘත තරඟ විභාගය මගින් බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ සම්පූර්ණ එකතුව **දෙකකි (02).** පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක වන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබයි. නිවේදනය කරනු ලැබූ පුරප්පාඩු අතරින් ඇතැම් පුරප්පාඩු හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ නොකර සිටීමේ බලය පත්වීම් බලධාරියා සතුය.

## **03.** වැටුප් පරිමාණය

අංක 10/2025 දරණ 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව **MN-6-2025** වැටුප් කේතය අනුව **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි 2 වන පන්තියේ** II **ශ්‍රේණියේ** තනතුර සඳහා ඒකාබද්ධ වැටුප් පරිමාණය **රු.62,230 - 10 X 1,190 - 11 X 1,360 - 15 X 1,670 114,140/= ක් වේ.** (මෙම වැටුප් පරිමාණයේ සිව්වන පියවරට එළඹීමට ප්‍රථම පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය). කෙසේ වෙතත් ඉහත සඳහන් චක්‍රලේඛයේ **III වන උපලේඛනයෙහි** සඳහන් විධිවිධාන පරිදි නියම කරන ලද වැටුප් මෙම තනතුර සඳහා ගෙවනු ලැබේ.

## **04.** සාමාන්‍ය සුදුසුකම්

04.1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

04.2. අයදුම්කරු මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර හයක (06) කාලය තුළ අවම වශයෙන් නොකඩවා වසර තුනක (03) කාලයක් උතුරු පළාතේ ස්ථිරව පදිංචි වී සිටිය යුතු වේ.

**(* සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**)**

**එසේ නැතහොත්**

අයදුම්කරු හෝ ඔහුගේ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර, උතුරු පළාතේ නොකඩවා වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචි අය විය යුතුය**.**

**(* සම්මුඛ පරීක්ෂණයේ දී** තම ස්ථිර පදිංචිය තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනය ඉදිරිපත් කළ යුතුය**)**

04.3. අයදුම්කරු මනා චරිතයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

04.4. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය වන විට අයදුම්කරු මෙම දැන්වීම මගින් නියම කර ඇති සියලුම සුදුසුකම් සම්පූර්ණයෙන්ම සපුරා ඇත්නම් පමණක්, බඳවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිටීමට අවම සුදුසුකම් ලත් අයෙකු ලෙස සලකනු ලැබේ.

04.5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරු වයස **අවුරුදු 21 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි** විය යුතුය.

## **05.** සුදුසුකම්

### **05.1** අධ්‍යාපන සුදුසුකම්

(1) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයකින්, පරිගණක විද්‍යාව (Computer Science) / තොරතුරු තාක්ෂණය (Information Technology) පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුය.

**හෝ**

(2)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයකින්, පරිගණක විද්‍යාව (Computer Science) / තොරතුරු තාක්ෂණය (Information Technology) එක් ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධියක් ලබා තිබිය යුතුය. (එම උපාධියට පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණයට අදාළ විෂය කරුණු අවම වශයෙන් 1/3 ක ප්‍රමාණයක් ඇතුළත් විය යුතුය.)

**හෝ**

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයකින්, පරිගණක විද්‍යාව (Computer Science) / තොරතුරු තාක්ෂණය (Information Technology) පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (Postgraduate Diploma) ලබා තිබිය යුතුය.

**හෝ**

(3)

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයකින් උපාධියක් ලබා තිබිය යුතුය.

**සහ**

ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතනයකින්, පරිගණක විද්‍යාව (Computer Science) / තොරතුරු තාක්ෂණය (Information Technology) පිළිබඳ පශ්චාත් උපාධියක් (Postgraduate Degree) ලබා තිබිය යුතුය.

(4)

i. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා මට්ටම - 07 (NVQ - 07) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබිය යුතුය.

**සහ**

ii. රාජ්‍ය/අර්ධ රාජ්‍ය ආයතනයකින් (Semi Government Institution) / තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගත් වෙනත් කුමන හෝ ආයතනයකින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ (Information Technology Field) වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්ද ලබා තිබිය යුතුය.

**05.2 ශාරීරික යෝග්‍යතාවය**

අයදුම්කරු දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තම තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමටත් හැකි යහපත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයෙකු විය යුතුය.

## 06. බඳවා ගැනීමේ පරිපාටිය

06.1. ලිඛිත පරීක්ෂණය මගින් කුසලතාවය පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දී බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථා සංග්‍රහය, ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදිය අනුව බඳවාගැනීම් සිදුකරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වූ හිමිකම් අවලංගු කරනු ලැබේ. මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සියලුම සුදුසුකම්, ඒවා තහවුරු කෙරෙන ලියකියවිලි පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතරින්, ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06.3. කෙසේ වෙතත්, ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ (Merit Order) අනුව සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සියලු සුදුසුකම් සපුරාලන අපේක්ෂකයින්, පවතින **පුරප්පාඩු සංඛ්‍යාවට අනුව** තෝරාගනු ලැබේ.

## 07. විභාග ගාස්තුව

අයදුම්කරු, විභාග ගාස්තු ලෙස **රු.500/=** මුදලක් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** යන නමට ලැබෙන පරිදි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ගෙවා, අදාළ ලදුපත අයදුම්පතෙහි අදාළ කොටුවේ නොගැළවෙන පරිදි අලවා එවිය යුතුය. කුමන හේතුවක් නිසා හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට ද අනුමත කරනු නොලැබේ.

## 08. අයදුම්කිරීමේ පිළිවෙල

08.1 මෙම නිවේදනය සමග පළකරනු ලබන අයදුම්පත www.np.gov.lk උතුරු පළාත් නිල වෙබ් අඩවියට පිවිස බාගත කරගෙන, සම්පූර්ණ කළ අයදුම්පත, **අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර** ලැබෙන පරිදි **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

08.2 අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **" NP/07/10/01/236"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.3 ඉල්ලුම්පත්‍රයේ පිටපතක් තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. ඉල්ලුම්පත්‍රයේ පිටපත් සහ ප්‍රගමන පිටපත් යනාදිය භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ. කෙසේ වෙතත්, **විභාග ප්‍රවේශ පත්‍රය එවීමෙන්, අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බවට අදහස් නොකෙරේ.**

08.4 අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ලැබුණු බවට කිසිදු දැනුම්දීමක් කරනු නොලැබේ. තවද අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පෙර, ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ නොකරන අයදුම්පත් කිසිදු පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.

08.5 ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 05 කට වත් පෙර විභාගය ප්‍රවේශ පත්‍රය නොලැබුණේ නම්, ඒ බව පහත සඳහන් විස්තර සහිතව **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය - **021-2219939** / ෆැක්ස් අංකය - **021-2219940** / විද්‍යුත් තැපැල - examppscnp@gmail.com)

- විභාගයේ නම
- අයදුම්කරුගේ සම්පූර්ණ නම
- ජාතික හැඳුනුම්පත් අංකය
- අයදුම්කරුගේ තැපැල් ලිපිනය
- අයදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය
- අයදුම්පතේ පිටපතක්
- අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය, ලියාපදිංචි තැපෑලේ අංකය සහ දිනය
- විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ සහතික කළ පිටපතක්

## 09. පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම

09.1 අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමකට පත්විය හැකිවන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් කුමන හෝ එකක් පිළිගනු ලැබේ.

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ii). වලංගු ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍රය

(iii). වලංගු ශ්‍රී ලංකා රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලියවිලිවලින් අතරින් එකක් හෝ විභාගයට පෙනී සිටීමේ දී ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය **"උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ "** අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන රෙගුලාසිවලට අයදුම්කරුවන් යටත් විය යුතුය. එම රෙගුලාසි උල්ලංඝණය කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත් විය යුතුය.

09.2 තවද, අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි පරිදි මුහුණ සහ ඉලෙක්ට්‍රෝනික උපාංග පැළඳ නොසිටින බව තහවුරු කරගැනීම සඳහා කන් දෙකම ආවරණය නොකර විභාග ශාලාවට ඇතුළු විය යුතුය. තවද, එසේ තහවුරු කරගැනීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරනු නොලැබේ. තවද, විභාග ශාලාවට ඇතුළත්වූ මොහොතේ සිට විභාගය අවසන් වී විභාග ශාලාවෙන් පිටත්ව යන තුරු අයදුම්කරුගේ අනන්‍යතාවය තහවුරු වන ආකාරයෙන් මුහුණ සහ කන් දෙක ආවරණය නොකර සිටිය යුතුය.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්

අයදුම්කරු තම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. මෙම විභාගයේ රෙගුලාසිවලට අනුව කිසියම් අයදුම්කරුවෙකු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව කුමන හෝ අවස්ථාවක සුදුසුකම් නොමැති අයෙකු බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේ දී ම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු ඉදිරිපත් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන කුමන හෝ අවස්ථාවක හෝ ඔහු/ඇය පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ඇත.

## 11. අත්සන සහතික කිරීම

සෑම අයදුම්කරුවෙකුම තමන්ගේ අත්සන සහතික කිරීම අනිවාර්යය වේ. අයදුම්කරුවන් තම අත්සන කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු, රු.854,880.00 ට නොඅඩු මාසික වැටුපක් ලබන ළඟම ඥාතියෙකු නොවන ස්ථිර රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු, ආගමික ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරණ අයෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

## 12. විභාග පරිපාටිය

මෙම ලිඛිත පරීක්ෂණය පහත සඳහන් **ප්‍රශ්න පත්‍ර 03 න්** සමන්විත වන අතර, මෙම විභාගය සිංහල සහ දෙමළ යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් තමන්ට අදාළ භාෂා මාධ්‍යයක් තෝරාගත යුතු අතර, විභාගයට අදාළ සියලුම ප්‍රශ්නපත්‍ර වලට එම භාෂා මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂාව පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| අංකය | ප්‍රශ්න පත්‍රය | විෂයය අන්තර්ගතය | කාලය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය, විභාග අපේක්ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පිළිබඳ දැනුම, පරිගණක නිර්මිතිය හා මෙහෙයුම් පද්ධති/මෘදුකාංග (වදන් සැකසුම්ල පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය, කාර්යාලයීය මෘදුකාංග පැකේජ) /දෘඩාංග, දෘඩාංග දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණය සහ නව අන්තර්ජාල සේවාවන්, විද්‍යුත් තැපැල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර පිළිබඳ දැනුම හා අධීක්ෂණ හැකියාව පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත වේ. | පැය 02 යි | 100 |
| | Information and Communication Technology | This paper shall consist to measure the knowledge and ability on supervision from the fields such as principles on Information and Communication Technology, computer architecture and operating systems, software (word processing, spreadsheets, presentations, database management, software packages applied in offices), hardware, data communication and computer network, internet, web designing, new internet services, e-mail and life cycle of the projects of Information and Communication Technology. | | |
| 02 | අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය, විභාග අපේක්ෂකයා සතු සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව සහ තර්කානුකූලව කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 යි | 100 |
| | Aptitude | The paper shall consist of questions to measure the ability on statistics, critical reasoning. The question paper shall consist of fifty (50) questions of multiple choice and short answers and all the questions should be answered. | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න පනහකින් (50) සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 යි | 100 |
| | General Intelligence | It is expected to assess the level of intelligence of the candidate in analytical skills, logical comprehension, interpretative ability, ability in application to other situations and arriving at conclusions, in response to problems presented in relation to numerical, lingual and figurative structure and inter-relations. Questions paper shall consist of questions of multiple choice and short answers and all the questions should be answered. | | |

<u>සටහන</u>

- මෙම විභාගය තරඟ විභාගයක් වන හෙයින් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලැබීමට නම් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක්වත් **40%** ලබාගත යුතු අතර ප්‍රශ්නපත්‍ර 03 සඳහා වන මුළු ලකුණු සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් සියයට පනහක්වත් **50%** අපේක්ෂකයන් විසින් ලබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් මෙම තරඟ විභාගයෙන් ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ (Merit Order) සළකා බලනු ලැබේ.
- පිළිතුරු පත්‍රයක අපැහැදිළි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ පවතින බව ඇගයීම්කරු විසින් තහවුරු කරනු ලැබුවහොත්, එම පත්‍රයෙන් ලකුණු අඩු කරනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල

අපේක්ෂකයින්ගේ අවසන් විභාග ප්‍රතිඵල උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවිය (www.np.gov.lk ) හරහා නිකුත් කරනු ලබන අතර, www.np.gov.lk ⟶ **Exams & Recruitments** ⟶ **Results** යන සබැඳිය වෙත පිවිසීමෙන් අපේක්ෂකයින්ට තම තනි පුද්ගල ප්‍රතිඵල සහතික නැරඹීමට සහ බාගත කිරීමට හැකියාව ඇත.

**සැළකිය යුතුය:-**

(i). මෙම විභාග දැන්වීමෙහි සඳහන් නොවන මොනයම් හෝ කරුණක් පිළිබඳව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.

(ii). මෙම විභාගය පැවැත්වීම හෝ අවලංගු කිරීම පිළිබඳ සම්පූර්ණ බලය උතුරු පළාතේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් සතුය.

(iii). මෙම නිවේදනයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිළි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයේ දුරකතන අංක 021-2219939 සමග සම්බන්ධ වන්න.

(iv). මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක දෙමළ මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැළකිය යුතුය.

(v). මෙම විභාගය පිළිබඳ නිවේදනය www.np.gov.lk උතුරු පළාත් සභාවේ නිල වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකිය.

**ආල්වාප්පිල්ලෛ සිරි**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
උතුරු පළාත
**2026.10.13**